# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/65/චක්‍රලේඛ/2021

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2022.05. 25

**චක්‍රලේඛ අංක : 2021/07(1)**

**සියළුම ප්‍රාදේශීය ලේකම්වරු**

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කරනු ලබන ඉඩම්වල අවම බෙදුම් සීමාව සංශෝධනය කිරීම</u>**

2021.10.28 දිනැති අංක 2251/48 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් හා 2022.02.07 දිනැති අංක 2266/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය පල කරන ලද 2021 ඉඩම් සංවර්ධන රෙගුලාසි මගින්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කරනු ලබන ඉඩම්වල අවම අනු බෙදුම් ඒකකය සංශෝධනය කිරීමට ක්‍රියා කර ඇත.

02. එම ඉඩම් සංවර්ධන රෙගුලාසි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2022.03.23 දින සම්මත කර ඇති බැවින්, 2021.11.03 දිනැති මාගේ චක්‍රලේඛ අංක 2021/07 මගින් ලබා දී ඇති උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී. බන්ඩුල ජයසිංහ

ඉඩම් කොමසාරිස් ජනරාල්


ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 | 011 287 3033

ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 | 011 286 4462

ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 | 011 288 3812

ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 | 011 287 3110

ඉඩම් III / காணி III / Land III ☎ 011 279 748 | 011 288 363

ඊමේල් ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk

වෙබ් ලිපිනය இணையம் Web Address - www.lancommdept.gov.lk

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/48 - 2021 ඔක්තෝබර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2021 ඉඩම් සංවර්ධන රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ආඥාපනතේ 25 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක හා ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍රයක කොන්දේසිවලට ඇතුලත් කර ඇති අවම අනු බෙදුම් ඒකකය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

   I. ගොඩ ඉඩම් - එම ඉඩම් පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම අනු බෙදුම් ඒකකය

   II. වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් - අක්කර 1 යි

   III. වාණිජ භෝග සඳහා බැහැර කර ඇති ඉඩම් - අක්කර 1 යි

IV. මධ්‍යම පාන්තික ඉඩම් - අක්කර 2 1/2 යි

V. අහස් දියෙන් වගා කරනු ලබන ගොඩ ඉඩම් - අක්කර 1 යි

3. මෙම සංශෝධිත අවම අනු බෙදුම් ඒකකයට අනුරූප වන ලෙස අවම භාගය නිර්ණය කළයුතු වේ.

4. දැනටමත් නිකුත් කර ඇති අවසර පත්‍රයක හෝ දීමනාපත්‍රයක අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය සඳහා ඉල්ලීම් ඉදිරිපත් වන අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් අවසර පත්‍රයේ හෝ දීමනාපත්‍රයේ පිටසනක් යෙදීම මඟින් සංශෝධනය කළ හැකි වේ. එම පිටසන 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

5. දීමනාපත්‍රයක් මඟින් බෙදාදී ඇති ඉඩම හෝ ඉන් කොටසක් නියමිත පූර්ව ලිඛිත අවසරයක් මත නොතාරිස් ඔප්පුවක් ( බැහැරකර ඇති අවස්ථාවක එම නොතාරිස් ඔප්පුවේ අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම ( ඉල්ලීමක් ඉදිරිපත් වන අවස්ථාවකදී ඉහත 4 රෙගුලාසිය පරිදි ක්‍රියාකල යුතු වේ. එහිදී යොදාගනු ලබන පිටසන 'ආ' ආකෘ සාරානුකූල විය යුතුය.

'අ' ආකෘතිය

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසරපත්‍/ දීමනාපත්‍ර වල අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම**

........................ දිස්ත්‍රික්කයේ ........................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................ ග්‍රාම නිලධාරී වසමේ ........................ අංක දරණ පිඹුරේ/ සිතියමේ අංක ........................ දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් ................ /අක් .......... රූඩ් ............... පර් ............... වන ඉඩම් කොටස සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කර ඇති අංක ......... දරන අවසරපත්‍රයේ / දීමනාපත්‍රයේ අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ............... /අක් ............... රූඩ් ............... ............... ලෙසත් අවම භාගය ............... ලෙසත් සටහන් කර ඇත. එම අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය පහත ස පරිදි සංශෝධනය කිරීමට මාගේ අනුමැතිය ලබාදෙමි.

I. අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ............... /අක් ............... රූඩ් ............... පර් ...............

II. අවම භාගය ............... ක් වේ.

......................................

ප්‍රාදේශීය ලේකම්

දිනය : ......................................

......................................

අවසරපත්‍රකරු / දීමනාපත්‍රකරු

දිනය : ......................................

'ආ' ආකෘතිය

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍ර නොතාරිස් ඔප්පු මගින් බැහැර කර ඇති අවස්ථාවලදී අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම**

........................ දිස්ත්‍රික්කයේ ........................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................ ග්‍රාම නිලධාරී වසමේ ........................ අංක දරණ පිඹුරේ/ සිතියමේ අංක ........................ දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් ............... /අක් .......... රූඩ් ............... පර් ............... වන ඉඩම් කොටස සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති අංක .......... දරන දීමනාපත්‍රයේ අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ............... /අක් ............... රූඩ් ............... පර් .......... ලෙසත් අවම භාගය ............... ලෙසත් සටහන් කර ඇත. එම දීමනාපත්‍රය මගින් පවරා දී ඇති සම්පූර්ණ ඉඩම/ ඉඩ

හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් ................. ක ප්‍රමාණයක් මාගේ අංක ....................... හා

....................... දිනැති ලිපිය මගින් ....................................................................................... ලිපිනයේ

......................................... යන අය වෙත බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බැවින් එම අනුමැතිය පදනම් කර

ගනිමින් ප්‍රසිද්ධ නොතාරිස් ......................................................... විසින් ලියා සහතික කරන ලද අංක .............................

දරන නොතාරිස් ඔප්පුව මගින් බැහැර කර ඇත. එම නොතාරිස් ඔප්පුවේ සඳහන් අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය පහත පරිදි සංශෝධනය කිරීමට මාගේ අනුමැතිය ලබාදෙමි.

I. අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ................ /අක් ................ රූඩ් ................ පර් ................

II. අවම භාගය ................ ක් වේ.

.........................................
ප්‍රාදේශීය ලේකම්
දිනය : .........................................

.........................................
පැවරුම්ලාභියා
දිනය : .........................................

11 - 221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2266/5 - 2022 පෙබරවාරි මස 07 වැනි සඳුදා - 2022.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් සංවර්ධන ආඥාපනත - රෙගුලාසි**

අංක 2251/48 හා 2021.10.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන ලද මාගේ නිවේදනයෙහි,

"1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

යන්න

"1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ( 464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි. "

ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 31 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0383/1

1A - G 35997– 60 (2022/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් සංවර්ධන ආඥාපනත - රෙගුලාසි

අංක 2262/50 හා 2022.01.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද මාගේ නිවේදනයෙහි,

"1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

යන්න

"1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ( 464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**එස්. එම්. චන්ද්‍රසේන,**
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 31 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0383/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.